වීරයෝ සහ හොරු සමඟ හෙළුවෙන්

දේශප්‍රේමියෙකුට දේශද්‍රෝහියෙකු වන්නට යන්නේ තත්පරයකට නොඇතු කාලයකි

වීරයෝ මිය යන්නේ එක් වරක් පමණි. ඔවුන් මැරි මැරි උපදින්නේ නැත. අපේ රටේ දශක තිහක කුරිරු යුද්ධයෙන් මිය ගිය සැබෑ වීරයෝ නිහඬවම සදකාලික නින්දක සැතපී ඇත. ඔවුන් මෙම යුද්ධයෙන් උපයා ගත් දෙයක් නැත. ඒ ලෙයින් උපන් දූ දරුවන්, එසේම ඔවුන්ගේ අඹුවන්,දෙමව්පියන් ඇඬූ කඳුළු හංගාගෙන ජීවිතය ගැටගසාගන්නට යෙදෙන ජීවිත අරගලය ඔබ අපට රහසක් නොවේ. අද අපේ රටේ ජනතාවට සැබෑ වීරයන් ක්‍රම ක්‍රමයෙන් අමතකව යයි. පෙරමුණේ සටන් කළ නම්ගම් නැති වීරයන් එසේ නිහඬව සැතපෙද්දී, මෙම යුධ ජයග්‍රහණයට සැබෑ නායකත්වයක් දුන්නා යැයි කියන සරත් ෆොන්සේකා අද මැරි මැරි උපදියි. ඔහු උපදින්නේ නිකම්ම නොවේ. මිලියන ගණන් මුදල් සමගිනි. අනෙක් පැත්තෙන් මෙම යුධ ජයග්‍රහණයේ සැබෑ වීරුවන් යැයි වීරුදාවලිය ලත් රාජපක්ෂ පරපුර උපයාගත් මුදල් කන්දරාව අපි තවමත් දන්නේ නැත. ඒවා දැනගන්නට ඔහුටද සරත් ෆොන්සේකා සේම බලය අහිමි වී පරාජිත පුද්ගලයකු බවට පත්විය යුතුය. ඔවුන්ගේ මුදල් කුමන රටක සේප්පුවල තිබේනවාදැයි අපි තවමත් දන්නේ නැත. එහෙත් මෙම ලිපියෙන් කතා කරන්නේ සරත් ෆොන්සේකා නමැති වීරයා පිළිබඳ පමණි.

ජනාධිපතිවරණයේ අපේක්ෂකයන්ගේ වත්කම් ප්‍රකාශන හෙළි කිරීමට මුලින්ම ඉදිරිපත් වූ අපේක්ෂකයා වන්නේ සරත් ෆොන්සේකා මහතාය. ඔහුගේ මැතිවරණ සටනේ තේමාව වූයේද දූෂණය හා වංචාවයි. තමා අවංකවම රට වෙනුවෙන් සටන් කළ වීරයෙකු බවත්, එම සටනේදී තුන්වරක්ම නොමැරී දිවි ගලවාගත් බවත්, සඳහන් කළ ඔහු ලක්ෂ්මේ බලයට හිමිකම් කීමට තමාට සැබෑ අයිතියක් ඇති බව සඳහන් කළේ එම වත්කම් ප්‍රකාශන රටටම පෙන්වමිනි. එහෙත් අද ඔහුගේ සැබෑ වත්කම් ක්‍රමයෙන් එළිවන්නට පටන් ගත්තේ ඥාතීන්ගේ සේප්පු තුළිනි.

සරත් ෆොන්සේකා බලයට පත් කිරීමට සැබෑම වෙහෙසක් දැරූ ජනතා විමුක්ති පෙරමුණ තවමත් මේ පිළිබඳව කිසිවක් ප්‍රකාශ කර නැත. 89යේ හීෂණයෙන් පසු ලෑල්ලටම අතුගෑවී ගිය ජේවීපෙ මුල්ම කාර්යභාර්ය වූයේ තම පක්ෂය ජනතාව අතරට යන්නේ කෙසේද යන්න සිතා ගැනීමයි.

අද ජන්ද 20 - 30 දාහක් ලබාගන්නා වික්‍රමබාහු කරුණාරත්නට ශ්‍රීලනිපයෙන් හෝ එජාපයෙන් ආසනයක් තරඟ කිරීමට හැකිවේ නම්. ඔහුට විශාල වැඩි ජන්ද ප්‍රමාණයකින් පාර්ලිමේන්තුවට යා හැකි ය. අප රටේ දේශපාලන ක්‍රමවේදය එයයි. ජේවීපීය තම සියළු ප්‍රතිපත්ති හා න්‍යායයන් අමතක කොට දමා ප්‍රධාන පක්ෂ දෙක පසුපස යන්නේ ඒ නිසාය. ඒ අතින් වික්‍රමබාහු අවංක ප්‍රතිපත්ති ගරුක දේශපාලන නායකයෙකි.

එහිදී ඔවුන් මෙද සරත් සේම එද චන්ද්‍රිකාට බලය ලබා ගැනීමට උදව් කළ ප්‍රධාන පක්ෂයක් බවට පත් විය. එහිදී ඔවුන්ගේ ව්‍යායාමය සාර්ථක විය. ඊට පසු ඔවුන් පාර්ලිමේන්තුවට ආවේද ප්‍රධාන බලය ඇති පක්ෂයේ පිහිටාධාරයෙනි. ඊළඟට ඔවුන් රජ කළේ මහින්දවයි. එද තනිවී සිටි මහින්දට උපරිම සහයෝගය දී ජනාධිපති වීමට පාරකැපූ ජේවීපී යේ ප්‍රධාන තේමාව වූයේ සියළු විජාතික බලවේග පරාජය කොට යුද්ධය දිනිය හැකි එකම නායකයා මහින්ද බවයි. එද අගමැතිකමේ සිටි මහින්දට විපක්ෂය එල්ල කළ ප්‍රධානම ප්‍රහාරය වූයේ ජාතිවාදය හා හෙල්පින් හම්බන්තොට සුනාමි ආධාර ගසා කෑමයි. ශ්‍රීලනිපයේ බලවතුන්ද එය නිහඬව අනුමත කරද්දී මහින්දව බේරා ගැනීමට ඉදිරිපත් වූයේ ජේවීපීයයි. එකළ සරත් ෆොන්සේකා පිළිබඳව අංශු මාත්‍රයක දැනුමක් ජේවීපියට තිබුණේ නැත. සරත් ෆොන්සේකා හමුදාපති වනතුරුම ජේවීපීය ඒ බව දැනගෙනවත් තිබුණේ නැත.

එහෙත් ජේවීපීයේ තුන්වෙනි ව්‍යායාමය නොහොත් සරත් ෆොන්සේකා බලයට පත්කර ගැනීමට දැරූ වෙහෙස පුස්සක් බවට පත්වූයේ ඇයි? ඒ මහින්ද ජේවීපීයේ එද ප්‍රධාන සටන් පාඨය වන විජාතික බලවේග පරාජය කිරීම සහ මව්බිම බේරා ගැනීමට සැබෑම නායකත්වයක් දුන් නිසාය. මෙතෙක් මේ රටේ පොරොන්දු දේශපාලනය බොරු බේගලයක් බවට පත්ව තිබියදී දුන් පොරොන්දු ඉෂ්ඨ කළ එකම නායකයා මහින්ද වීමයි. තිබුණාටත් වඩා පාර්ලිමේන්තුවේ වැඩි ආසන ප්‍රමාණයක් සහ බලය පිළිබඳව අධිතක්සේරුවක සිටි ජේවීපීයට

ලක්ෂ්මන් කොඩිතුවක්කු

අද තම පාර්ලිමේන්තුවේ තිබෙන ආසන ප්‍රමාණය රැකගැනීමටද පක්ෂය උපන්ද සිටම වෛර කළ එජාපයේ පිහිට පැතීමට සිදුව ඇත. දූෂණය, වංචාව, හීෂණය ගැන කථා කළ ජේවීපීයට අද වන්නේ යූඇන්පීය පිරිසිදු පක්ෂයකි, සරත් ෆොන්සේකා හංසයා සේම සුදුපාට පිරිසිදු වන්තයෙකි.

රනිල් වික්‍රමසිංහ ඇතුළු පිරිස විසින් අතරමං කර දැමූ සරත් ෆොන්සේකාට ජනතා විමුක්ති පෙරමුණ සමඟ තනිව ගමනක් යා හැකිද? අප රටේ ජනතාව තවමත් කතිරය ගසන්නේ පක්ෂයටය. එක්සත් ජාතික පක්ෂයෙන් පනුවෙක් ඉදිරිපත් කළද ශ්‍රීලනපයෙන් කුඩැල්ලෙක් ඉදිරිපත් කළද එම පක්ෂ දෙකට කවදත් වැඩි බලයක් ගත හැක. ලක්ෂ 25 - 30ක ජන්ද ඒ වෙනුවෙන්ම පෙළ ගැසී සිටී. මෙවර සරත් ෆොන්සේකා ලැබූ ජන්ද ඔහු ලැබූ පෞද්ගලික ජන්ද නොවේ. ඒ එජාපයේ ජන්දයි. චන්ද්‍රිකා අත්තනගල්ලට ගොස් මහින්දට විරුද්ධව කෑ ගැසුවත් අත්තනගල්ල ජනතාව ජන්දය දෙන්නේ බණ්ඩාරනායක පරපුරට නොවේ. බණ්ඩාරනායක විසින් නිර්මාණය කළ ශ්‍රීලනිපයටයි. කුමන හොරෙකු ඉදිරිපත් කළද එම පක්ෂ දෙක හැමද අප රටේ පාලනය ගෙනගියේ එම නිසාය. අද ජන්ද 20 - 30 දාහක් ලබාගන්නා වික්‍රමබාහු කරුණාරත්නට ශ්‍රීලනිපයෙන් හෝ එජාපයෙන් ආසනයක් තරඟ කිරීමට හැකිවේ නම්. ඔහුට විශාල වැඩි ජන්ද ප්‍රමාණයකින් පාර්ලිමේන්තුවට යා හැකි ය. අප රටේ දේශපාලන ක්‍රමවේදය එයයි. ජේවීපීය තම සියළු ප්‍රතිපත්ති හා න්‍යායයන් අමතක කොට දමා ප්‍රධාන පක්ෂ දෙක පසුපස යන්නේ ඒ නිසාය. ඒ අතින් වික්‍රමබාහු අවංක ප්‍රතිපත්ති ගරුක දේශපාලන නායකයෙකි.

ගත්තේ ඔහු කළ වංචාවලටවත්, ආයුධ වෙළඳම් අල්ලස් නිසාවත් නොවේ. ඔහු ඒ සියල්ල කළානම් කර ඇත්තේ රජය දැනුවත්ව බව ඕනෑම පොඩි එකෙකු පවා දනී. ඔහු අත් අඩංගුවට පත් වන්නේ යුධ රහස් ජාත්‍යන්තරයට යන නිසාය.

දේශප්‍රේමියෙකුට දේශද්‍රෝහියෙකු වන්නට යන්නේ තත්පරයකට වැඩි කාලයක් නොවන බව හොරු සමඟ හෙළුවෙන් සිටින දේශපාලන නායකයන් නොදන්නා බව ඇඳුම් ඇඳගෙන සිටින අපේ රටේ දුප්පත් ජනතාව හොඳින් දනී. ඇස් වසාගෙන මහපාරේ නිරුවතින් ඇවිදින මිනිසෙකුට තමාව කවුරුත් දුටුවද කමිනැත. එහෙත් ඔහුව දකින ජනතාව ඔහු කවිද යන්න හොඳින් දනී. දේශද්‍රෝහීන්, ප්‍රේමීන් පිරි ඇති අප රටේ සැබෑම ප්‍රේමියා, ද්‍රෝහියා තේරීමට කාලය සුනංගු කිරීම බොරු වැඩක් කියා අද කළ හැකි එකම කාර්යය වන්නේ මේ සියළු ප්‍රේමීන්, ද්‍රෝහීන්, පළිගැනීම්, වෛරය අමතක කර දමා දුප්පත් ජනතාව ගැන සිතා රට ගොඩගැනීමේ කාර්යභාර්ය ඇරඹීමයි.

යුධ වීරයන් බිහිවන්නේ යුද්ධයක් තිබුණොත් පමණකි. දැන් යුද්ධය අවසානය. වීරයන් වූ ද්‍රෝහියන්ද, ද්‍රෝහියන් වූ වීරයන්ද, ඒ සමගම වීරයන් වූ වීරයන්ද අපට සිටි සැබෑ වීරයන් ජීවත්වන්නේ අවංක මිනිසාගේ හදවත් තුළය. දැන් වීරත්වයට අවශ්‍යවන්නේ රට ගොඩගැනීමටයි. ඒ නිසා චේතිය ජාතකයේ මෙන්ම ජනතා ජන්දයෙන් සුදුස්සෙක් පත්වී ඇත. ජනතාව ඔහුව සුදුසු තැන තබා බලා සිටින්නේ එම කාර්යය කෙරෙන තුරුය. ඔහුට ඉඩ ප්‍රස්ථාව ලබා දීම අපේ යුතුකමයි. නිසිකළ ඔහු එසේ නොකරන්නේ නම් පන්නා දැමීමද ජනතාවගේ යුතුකමයි. ■

අනියත ලෝකයේ සැමගේ උරුමය සේ නොසිතූ පරිදි ශ්‍රී ලංකාවේ දින කිපයක් අසනීපව සිට හදිසියෙන් පසුගිය ජනවාරි 29 වන දින අප අතරින් වෙන්ව ගිය දේවිකා රූපසිංහ වන මගේ භාර්යාව වෙනුවෙන් සෙත් පතා දින ගණනක් බෝධි පූජා පවත්වමින් ඇයව බේරා ගැනීමට උත්සාහ ගත් විහාරස්ථාන වල භික්ෂූන් වහන්සේලාටත් එයට සහභාගි වූ නෑදෑ හිත මිතුරන්ටත් අවමංගල කටයුතු වලදී සෑම අයුරින්ම උදව් උපකාර කළ ශ්‍රී ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ නෑදෑහිත මිතුරන්ටත් අප පවුලේ හෘදයංගම ස්තූතිය පිරිනමමු

කමල් රූපසිංහ ඇතුලු දරුවන්

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia